---

කොළඹ මහා නගර සභාව

කොළඹ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජූනි 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජූනි 14 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කොළඹ මහා නගර සභාවේ2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් ගත කර තිබූ රු.185,503,015ක අවසාන තොගයේ වටිනාකම තොග පොත් ශේෂ අනුව ගණනය කර තිබුණි.

(ආ). සභාවේ සේවකයින් තිදෙනෙකු රු.11,688,530 ක වන්දි ඉල්ලා සභාවට එරෙහිව පවරා තිබූ නඩු 3ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විභාග වෙමින් පැවතියද ඒ සම්බන්ධ අසම්භාව්‍ය බැරකම්, ගිණුම් වල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ).සමාලෝචිත වර්ෂයේදී මාර්ග සංවර්ධන කටයුතු වෙනුවෙන් මාර්ග සංවර්ධන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ රු.50,290,165 ක්, ආදායම් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට ණයගැති ගිණුමක බැර ශේෂයක් ලෙස ඉදිරියට ගෙනගොස් තිබුණි.

(ඈ). 2011 වර්ෂය තුළ මිලදී ගෙන තිබූ වාහන 27 ක වටිනාකම රු. 50,095,548 ක් වුවද රු. 11,792,299 ක් පමණක් වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ). ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ගිවිසුම්ගත වටිනාකම කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාවේදීම වත්කම් ලෙස ගිණුම් ගත කර ණයහිමියන්ට බැර කිරීම නිසා 1998 සිට 2011 දක්වා පිරිනමා තිබූ කොන්ත්‍රාත් වලින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.91,581,279ක ව්‍යාජ වත්කම් සහ බැරකම් මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කෙරිණි.

(ඊ). සමාලෝචිත වර්ෂයේ අවසානයට ගොඩනැගිලි ගිණුමට අයකර තිබූ රු. 28,110,069 ක වටිනාකමට අදාල ඉදිකිරීම් කිසිවක් 2011 දෙසැම්බර් 31 දිනට කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය නොවයෙන් එම වටිනාකමද ව්‍යාජ වත්කමක් ලෙස නිරීක්ෂණය විය.

(උ). සමාලෝචිත වර්ෂය අවසානයට ඇණවුම් කර ලැබී නොතිබූ යන්ත්‍ර හා උපකරන වල වටිනාකම වූ රු.13,962,597 ක් වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඌ). සභාවේ වැඩසටහන් 3 කට අදාලව රු.14,985,635 ක 2012 ජනවාරි මාසයේ දී ගෙවා තිබුණ ද 2011 වර්ෂය තුල ගෙවූ සේ සලකා ගිණුම් පිලියෙල කර තිබුණි.

(එ). ලැබිය යුතු ආදායම් රු.1,183,663ක් හා ගෙවිය යුතු ගිණුම් රු.1,323,722 ක්ද ගිණුම් වලින් අත්හැර තිබුණි.

(ඒ). 2004 සිට 2008 දක්වා කාලය තුල කුලී මුදල් නොගෙවීම හේතුවෙන් පවරා ගෙන තිබූ වෙළඳ සැල් වලට අදාලව තවදුරටත් 20% ක අධි ගාස්තු එකතු වෙමින් පැවති අතර 2011 දෙසැම්බර් 31 දිනට ඒ ආකාරයෙන් රු.3,590,582 ක ශේෂයක් දඩ හා හිඟ කුලී ලෙස ගිණුම් ගත වී තිබුණි.

(ඔ). කොළඹ නගරයේ පොදු යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ ලැබීතිබූ ප්‍රතිපාදන වලින් ප්‍රතිපූරණය කරන නොලබන ප්‍රාරම්භක ව්‍යාපෘති වියදම් රු. 3,227,110 ක් වියදම් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට විවිධ ණයගැතියන් ලෙස දක්වා තිබුණි.

(ඕ). 2010 දෙසැම්බර් 31 දින සිට එකතු කල අගය මත බදු සංශෝධනය වීමෙන් පසුව රඳවාගෙන තිබුණු රු. 576,472 ක හා රු.710,080 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීම වෙනුවට, ආදායමට ගෙන තිබුණි.

(ක) 1974 වසරේ සිට ඉදිරියට ගෙන එමින් තිබෙන ගිණුම් 33ක හර එකතුව රු.313,642,510 ක හා ගිණුම් 26ක බැර එකතුව රු.181,020,547ක නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.2. නොසැසඳුන ගිණුම්

(අ). ගිණුම් විෂයයන් 38ක ගිණුම් ශේෂයන් සහ ඒවාට අදාල උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර නොසැසඳීම් වල එකතුව රු.23,774,346 ක් විය.

(ආ). එක් එක් දෙපාර්තමේන්තු වල සේවක ණය ශේෂ හා ඒවාට අදාල ගිණම් අනුව ණය ශේෂ අතර රු.52,067,204ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3. විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ). අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.11,694,354,463 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) එකතුව රු.1,093,177ක් වූ ගෙවීම් වවුචර් 32 ක් 2013 ජූනි 14 දින දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ). 2013 මැයි 08 දින වන විට විගණන විමසුම් 21කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු.2,651,146,538 ක් විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වු පුනරාවර්ථන වියදම රු.161,837,367 ක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වු පුනරාවර්ථන වියදම රු.125,446,519 ක විය.

(ආ). මහ නගර සභාව සැලකිය යුතු කාලයක සිට දිගින් දිගටම ඌනතා ලබමින් කටයුතු කර ගෙන එනු ලබන තත්වයක් නිරීක්ෂණය වූ අතර ඒ නිසාම සභාවේ කාරක ප්‍රාග්ධන බාදනය දිගින් දිගටම සිදුවීම මත සභාවේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අයහපත් බලපෑම් ඇතිකර තිබුණි. ඉකුත් වර්ෂ 5ක ඌනතා පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | ඌනතාවය |
|---|---|
| | රු. |
| 2006 | (276,605,620) |
| 2007 | (368,550,962) |
| 2008 | (304,804,165) |
| 2009 | (360,539,777) |
| 2010 | (125,446,520) |

(ඇ) ඉකුත් වර්ෂ වල ප්‍රතිපාදන සලසා නොමැති ලැබිය යුතු / ගෙවිය යුතු හා ආදායම් / වියදම් ඉකුත් වර්ෂ ගැලපීම් ගිණමක් මගින් ගිණුම් ගත කිරීම සභාව දිගින දිගටම කරගෙන එමින් තිබෙන නිසා යම් වර්ෂයක මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ අවිනිශ්චිත තත්වයක්

නිරීක්ෂණය විය. ඒ අනුව ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතඵලයට ඇති වූ බලපෑම පහත පරිදි වේ.

| ගිණුම් වර්ෂය | මූල්‍ය ප්‍රතිඵල අතිරික්තය/(ඌනතාවය) | ඊලඟ වර්ෂයේ කර තිබූ ශුද්ධ ගැළපීම හර/බැර | ගැලපීමෙන් පසු ශුද්ධ ප්‍රතිඵලය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2005 | 90,846,722 | 49,396,657 | 140,243,379 |
| 2006 | 360,001,825 | (14,894,954) | 345,106,871 |
| 2007 | (614,038,292) | (152,073,255) | (766,111,547) |
| 2008 | (162,900,199) | 204,851,320 | 41,951,121 |
| 2009 | 818,149,934 | 233,731,266 | 1,051,881,200 |
| 2010 | (470,289,942) | 170,894,201 | (299,395,741) |

2.2 මූල්‍ය පාලනය.

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා/අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුම් දෙකක සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය අවසානයට පිළිවෙළින් රු.744,088,787ක හා රු.752,570,824 ක අයිරා නිරීක්ෂණය විය.

(ආ) බැංකු ගිණුම් 07ක් සම්බන්ධව බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී දින 25 සිට දින 60 දක්වා ප්‍රමාදයක් සිදුව තිබුණි.

(ඇ) බැංකු සැසඳුම් ප්‍රකාශ වල දැක්වුණු ගැලපුම් විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| | බැංකු ගිණුම් සංඛ්‍යාව | වසර - 1 | වර්ෂ 01-03 දක්වා | වර්ෂ 03 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| මුදල් රෙගුලාසි 396(ඩී) ප්‍රකාරව කටයුතු නොකරන ලද බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් | 02 | 2,493,724 | 931,571 | 1,297,229 | 4,722,524 |

| | | | | | |
|---|---|---|---|---|---|
| හඳුනා ගැනීමට කටයුතු නොකළ බැර ශේෂ | 02 | 89,596 | 726,303 | 786,382 | 1,002,281 |

(ඇ). ඛනිජ තෙල් අශ්‍රිත නිශ්පාදන මිලදී ගැනීම සඳහා වූ පෙර ගෙවුම් ගිණුමේ දැක්වෙන රු.6,247,554 ක ශේෂය තුල 2002 සිට 2009 වසර දක්වා කරන ලද ඉදිරි ගෙවීම් රු.5,943,264 ක් ද, ඛනිජතෙල් නොවන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වූ පෙර ගෙවීම් ගිණුමේ දැක්වෙන රු.42,323,992 ක ශේෂය තුල 2010 හා ඊට පෙර වසර වල සිට පැවත එන රු.41,735,584 ක ශේෂයක්ද ඇතුලත්ව තිබුණු අතර ඉන් බොහොමයක් අත්තිකාරම් නිරවුල් කර ඇති බවට හඳුනාගෙන ඇති බව විගණනයට වාර්තා කර තිබුණද මේ දක්වා ගිණුම් වල අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි.

(ඉ). ඛනිජ තෙල් ආශ්‍රිත නිශ්පාදන මිලදීගැනීමේ දී අදාල වටිනාකමට වඩා වැඩිපුර රු.3,875,489ක් ගෙවා තිබූ අතර එම මුදල් මාස 04 සිට වසර 07 දක්වා කාලයක් තුල පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය.

---

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

---

නගරාධිපති වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත |
|---|---|---|---|

| | | රු.000' | රු.000' | හිඟය<br>රු.000' |
|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 3,000,000 | 2,248,050 | 2,975,379 |
| (ii) | බදු කුලී | 180,256 | 151,031 | 540,468 |
| (iii) | බලපත්‍ර හා ගාස්තු | 34,321 | 34,321 | - |
| (iv) | වෙනත් ආදායම් | 46,946 | 26,953 | 19,993 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i). උසාවි දඩ | 491,397,490 |
| (ii). මුද්දර ගාස්තු | 918,726,819 |

2.3.3 වරිපනම් බදු.
----------------

(අ). 2011 දෙසැම්බර් 31 දිනට එක් වරිපනම් ඒකකයකින් රුපියල් ලක්ෂ පහ ඉක්මවූ මුළු දේපල සංඛ්‍යාව 672 ක් වූ අතර, එකී දේපල වලින් එකතුව රු1,455,059,268 ක් හිඟ හිට තිබුණි. හිඟ රුපියල් මිලියනයට වැඩි දේපල සංඛ්‍යාව 289 කින් රු.1,171,520,336 ක් හිඟ හිට තිබුණි. මෙම හිඟ ශේෂයන් මුළු හිඟ බදු ප්‍රමාණයෙන් 80%ක් නියෝජනය විය.

(ආ). හිඟ වරිපනම් බදු රු.54,402,525 කට අදාලව 2006 හා 2007 වර්ෂ වල වෙන්දේසි කර තිබ දේපල 116ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම දේපල හිමියන් මේ වන තෙක් දේපල බුක්ති විඳිමින් සිටින බව නිරීක්ෂණය විය.

(ඇ). සභා බලප්‍රදේශය තුල රජයේ දේපල 3,389කින් දේපල 1571ක හිඟ බදු ශේෂය රු.244,680,682ක් විය. එම ප්‍රමාණය මුළු හිඟ බදු වටිනාකමින් 17%ක් විය.

(ඈ). මහා නගර සභා ආඥා පනතේ 254 අ (1) හා (2) වගන්තිය හා 256 වගන්තිය ප්‍රකාර මහ නගර සභාවට අයවිය යුතු වරිපනම් බදු අයකර ගැනිම සඳහා අවශ්‍ය සියලුම පියවර ගැනිම නාගරික කොමසාරිස් වරයාගේ කාර්ය විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.2,682,525,723 ක හිඟ වරිපනම් බදු හා වරෙන්තු ගාස්තු නොගෙවන දේපල, තහනම් කර වෙන්දේසියේ විකුණා මුදල් අයකර ගැනිමට 2005 වර්ෂයෙන් පසු සමාලෝචිත වර්ෂය අවසානයට වන විටත් පියවර ගෙන නොතිබුණි.

2.3.4. හිඟ කුලී

----------

මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 254 අ (1) හා (2) වගන්ති ප්‍රකාර මහා නගර සභාවට අය වියයුතු ආදායම අය කර ගෙන එය සභා අරමුදල් වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම නාගරික කොමසාරිස්ගේ කාර්යය වියයුතු වුව ද, හිඟ කුලී අය කර ගැනීමට/ සන්තකය ආපසු භාර ගැනීමට කඩිනමින් පියවර නොගැනීම නිසා, හිඟ කුලී හා දඩ ලෙස රු.228,243,319 ක් ගිණුම්ගත වී තිබුණි.

2.3.5. බොරුැල්ල සුපිරි වෙළඳ සංකීර්ණයේ හිඟ කුලී

----------------------------------------------------

(අ). 2011 දෙසැම්බර් 31 දිනට හිඟ කුලි රු.21,000,571 කට අදාල කඩ 53 ක් මුදා තබා තිබුණද,කඩ 38 ක් සඳහා ගිවිසුම් පත් හෝ පැවරුම් ලිපි පශු වෛද්‍ය දෙපාර්තමේන්තුව විසින් නීති අංශයට ඉදිරිපත් නොකිරීම නිසා නීතිමය පියවර ගැනීමට නොහැකි වී තිබුණි. ඉතිරි වෙළඳසැල් 15 සඳහා එන්තර්වාසි යවා තිබුණද ලිපිනයන් නිවැරදි නොවීම හා පදිංචිය හැර යාම නිසා එන්තර්වාසි 10 ක් ආපසු එවා තිබුණි. මේ නිසා වෙළඳසැල් 48 කින් අයවිය යුතු රු.8,303,893 ක කුලී හා රු.10,280,857 ක දඩ අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ). කුලි නොගෙවීම මත කඩ ආපසු පවරා ගැනිම වැලැක්වීම සඳහා බොරුැල්ල සුපිරි වෙළඳ සංගමය හා කඩ හිමියන් හය දෙනෙකු පවරා තිබූ නඩු තුනක් නිශ්ප්‍රභ වී ඇති බව නීති දෙපාර්මේන්තුව විසින් 2011 නොවැම්බර් 23 නාගරික භාන්ඩාගාරිකට දැනුම් දී තිබුණද විගණිත දින දක්වා සන්තකය ආපසු ලබාගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ). තෙමසක කාලයක ඉක්මවා කඩ කුලී හිඟ හිටි අවස්ථා වලදී වෙළඳසැල් ආපසු පවරා ගැනීම කල යුතුව තිබුණද, 2011 වර්ෂය තුල කිසිදු කුලියක් ගෙවා නොතිබූ කඩ බක්කි හා වෙළඳසැල් 70 ක් සම්බන්ධයෙන් වෙළඳසැල් පැවරීමේ ලිපියේ (ඇ) ඡේදය ප්‍රකාරව කටයුතු නොකර ව්‍යාපාර පවත්වා ගැනීමට ඉඩ හැර තිබුණි. එකී වෙළඳසැල් / කඩබක්කි වලින් 2011 දෙසැම්බර් 31 දින වන විට රු. 43,190,364 ක කුලී හා රු.3,257,277 ක

අධි ගාස්තු අයවිය යුතුව තිබුණි. යොමුගත ලිපියට අමතරව වෙළඳ සැල් හිමියන් හා සභාව අතර ඇති කර ගෙන තිබූ ගිවිසුමේ 11 වන ඡේදය ප්‍රකාරව සෑම වසරකම ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබා ගත යුතු වුව ද, 2008 වසරේ සිට බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාරිකයන් 69 දෙනෙකු සඳහා නීතිමය කටයුතු කර නොතිබුණි.

## 2.4. නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

(අ). වටිනාකම තක්සේරු කර නොමැති වාහන 09ක් නාගරික කර්මාන්තශාලා වැඩබිම තුළ විවිධ කාලගුණික බලපෑම් වලට හසුවෙමින් දිරාපත් වෙමින් තිබුණි.

(ආ). මහජන බැංකුවේ ජංගම ගිණුම් 2ක එකතුව රු. 617,771 ක මුදල් ශේෂය අවුරුදු 5ක පමණ සිට නිෂ්ක්‍රීයව පැවැතින.

## 2.5. සේවක ණය

(අ). සේවක ණය ගිණුමෙහි ඇතුලත් අක්‍රිය ණය ශේෂය රු.18,703,903 ක් වූ අතර එහි කාල විශ්ලේෂණය පහත පරිදි විය.

| අක්‍රිය ණය | කාල විශ්ලේෂණය | | | |
|---|---|---|---|---|
| මුදල | වසර 1 ට අඩු | වසර 1 ට වැඩි 3ට අඩු | වසර 3 ට වැඩි 5ට අඩු | වසර 5 ට වැඩි |
| රු. | රු. | රු. | රු. | රු. |
| 18,703,903 | 1,458,025 | 1,543,757 | 2,568,295 | 13,133,826 |

(ආ). ඊට අමතරව කාර්ය මණ්ඩල ණය රු. 119,026,735 ක වසර ගණනාවක සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් තිබුණි.

## 2.6. ආර්ථික නොවූ ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2010 නොවැම්බර් 23 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණු බොරැල්ල හා කිරුලපන පොදු වෙලඳ පොලවල් පිරිසිදුකිරීම් සේවා සම්බන්ධයෙන් 2012 මාර්තු 14 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී නියමිත පරිදි පිරිසිදු කිරීම සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය. ඉහත තත්වය පිළිබඳව අදාල වෙළෙඳපල පරීක්ෂකවරුන් විසින් 2011 මාර්තු 01 හා 2011 ඔක්තෝම්බර් 21 දිනයන්හිදී නාගරික පශුවෛද්‍ය වරයා වෙත වාර්තා කර තිබුණි. එසේ වුවද ගිවිසුමේ 03 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොමැතිව සමාලෝචිත වර්ෂය තුල කොන්ත්‍රාත්කරුට රු.3,365,984 ක් ගෙවා තිබුණි.

(ආ). 2010 ජූලි 28 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණු කොල්ලුපිටිය සුපිරි වෙලෙඳපල පිරිසිදු කිරීමේ සේවාව නිසි ලෙස සිදුකර නොතිබුණු බව වෙළෙඳපල පරීක්ෂකවරුන් විසින් 2010 අගොස්තු 31, 2010 සැප්තැම්බර් 23 හා 2011 පෙබරවාරි 20 දිනයන්හිදී නාගරික පශුවෛද්‍ය වරයා වෙත වාර්තා කර තිබියදී, 2010 අගෝස්තු සිට 2011 ජුනි මාසය දක්වා කොන්ත්‍රාත්කරුට රු:548,717ක් ගෙවා තිබුණි. වෙළඳපල පිරිසිදු කිරීම සඳහා නගර සභා සේවකයින් යෙදවීම වෙනුවෙන් වැටුප් හා අතිකාල දීමනා ලෙස එම කාලයට අදාලව රු:1,039,049ක් ද ගෙවා තිබුණි.

(ඇ). ඩීන්ස් පාර පොදු වෙලදපලෙහි, පළමු මහල පදික වෙළඳ සංකීර්ණයක් ලෙස ස්ථාපිත කිරීම සඳහා කඩ බක්කි 41ක් ඉවත් කර විදුලි ආලෝකය ලබා ගැනිමට 2011 ජනවාරි 12 දින රු.124,701ක්ද තින්ත ආලේප කිරීම සඳහා රු,460,097ක් ද වැය කර තිබුණු අතර දෙවන මහල 2011 පෙබරවාරි 02 දින ප්‍රතිසංස්කරණය සඳහා රු. 820,784ක් ද වැය කර තිබුණි. එහෙත් විගණිත දිනය වන 2012 මාර්තු 16 දින දක්වා එම පරිශ්‍ර ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

2.7. අවිධිමත් ගනුදෙනු.
--------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ඡේදයේ විධිවිධාන වලට පටහැනිව 2010 ජුලි 01 දින සිට 2011 නොවැම්බර් 30 දින දක්වා රු.111,450 කට මහා නගර සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යන ආදායම් නොලබන රථගාල් කළමනාකරණය කිරීම, ටෙන්ඩර් කැඳවීමකින් තොරව පෞද්ගලික ආයතන 02 කට ලබා දී තිබුණි.

(ආ) රෝග නිවාරණ දෙපාර්තමේන්තුව සඳහා ඖෂධ මිලදී ගැනීමේ ටෙන්ඩර් ගිවිසුමේ 1 වන කොටසේ 18 වගන්තිය ප්‍රකාර යටත් පිරිසෙයින් අවුරුදු 02 ක කාලයකට වැඩි කල් ඉකුත් වන දින සහිත බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගත යුතු වුවත්, වසර 2කට වඩා අඩු කාලයකින් කල් ඉකුත් වන ඖෂධ වර්ග 7ක් 2011 මාර්තු 22 දින රු.549,104ක පිරිවැයකට මිලදී ගෙන තිබුණි.

(ඈ). ගිවිසුමේ 2 වන කොටසේ 03වන වගන්තිය ප්‍රකාර ඖෂධ ඇණවුම් කළ දින සිට දින 14 ක් ඇතුළත හෝ ඊට පෙර එසේ නැතිනම්, එකඟ වූ දිනට ඖෂධ සැපයිය යුතු වුවත් , 2011 මාර්තු 04 දින සැපයිය යුතු වූ ඖෂධ 14ක් සපයා තිබුණේ 2011 අප්‍රේල් 04 දින සිට 2011 ජූනි 10 අතර කාල පරිච්ඡේදය තුල දී බැවින් ඖෂධ සැපයීමේ දී දින 29 සිට දින 97 ක් දක්වා ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ඇ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පශු වෛද්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිළධාරීන් දෙදෙනෙකුට ලබා දී තිබුණු නියෝජ්‍ය ප්‍රධාන නාගරික පශු වෛද්‍ය නිළධාරී තනතුරු වල වැඩබැලීමේ පත්වීම් වෙනුවෙන් පත්වීම් බලධාරියා වනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වුවද, නාගරික පශු වෛද්‍යවරයා විසින් විධිමත් පදනමකින් තොරව 2006 අගෝස්තු 06 සිට 2012 අගෝස්තු 29 දක්වා පත්වීම් ලබා දී තිබුණි.

(ඉ) රෝග නිවාරණ දෙපාර්තමේන්තුව සඳහා ඖෂධ මිලදී ගැනීමේ දී ඖෂධ වර්ග 4ක් සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් අඩු මිල ඉදිරිපත් කර තිබුණ ද, වැඩි මිල ඉදිරිපත් කර තිබූ වෙනත් ආයතනවලින් මිලට ගැනීම නිසා රු.1,402,000 ක මුදලක් 2011 වර්ෂයේදී වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

2.8 කොන්ත්‍රාත් පරිපාලනය.

--------------------------

2.8.1. <u>බටහිර බෙහෙත් ශාලාව හා නිල නිවාසය ඉදි කිරීම</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 ඔක්තෝම්බර් 12 වන දින රු.21,532,526ක මුදලකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට ලබා දී තිබුණු කොටා පාර බටහිර බෙහෙත් ශාලාව හා නිල නිවාස ඉදිකිරීම් පිළිබඳව 2012 ජනවාරි 03 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂණයේ දී කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුව අනුව එම පරිශ්‍රය තුල සිටුවිය යුතු රු.77,900ක් වටිනා මල් පැල සිටුවා නොතිබූ අතර ඒ වෙනුවට වෙනත් මල් පැල සිටුවීම වෙනුවෙන් රු.202,150 ක් 2011 පෙබරවාරි 28 දින ගෙවා තිබීම නිසා රු.124,250ක වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය විය.

(ආ). අවසාන ගෙවීම් සහතිකය ප්‍රකාරව, මිල උච්චාවචනයන් නොමැති බව දක්වා තිබුණ ද, රු.178,114 ක අමතර වියදමක් බිල්පතට එකතු කර 2011 පෙබරවාරි 28 දින ගෙවා තිබුණි.

(ඈ). ඇස්තමේන්තුවට ඇතුළත් කළයුතු වැඩ විෂයයන් මුල් ඇස්තමේන්තුවට ඇතුළත් වී නොතිබු අතර, ඒවා අතිරේක වැඩ විෂයයන් යටතේ දක්වා රු.207,306 ක් 2011 පෙබරවාරි 28 දින ගෙවීම් කර තිබුණි.

2.8.2. කොටහේන බෙහෙත් ශාලා සංකීර්ණය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගොපෙදේශ සංග්‍රහයේ 5.4.8 (ආ) ජේදය ප්‍රකාර වැඩ සඳහා වූ යම් කොන්ත්‍රාත්තුවක් සඳහා ඉදිරිපත් කරන කාර්ය සාධන බැදුම්කරය වැඩ නිමකිරීමට අපේක්ෂිත දිනය පසුවී දින 28 දක්වා වලංගු වියයුතු වුවද, 2008 දෙසැම්බර් 23 දින කොටහේන බෙහෙත් ශාලා සංකීරණය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් කරුවෙකුට රු.18,160,049 ක ගිවිසුම්ගත වටිනාකමට පිරිනමා තිබූ කොන්තාත්තුවේ ගිවිසුම අනුව වැඩ නිම කල යුතු දිනය 2010 දෙසැම්බර් 23 දින වුවද, කාර්ය සාධන බැදුම්කර ඉදිරිපත් කරමින් ඉදිකිරීම් කටයුතු කරගෙන ගොස් තිබුණු අතර, කාර්ය සාධන බැදුම්කරය 2011 නොවැම්බර් 22 දින කල් ඉකුත්ව තිබුණි. ඉදිකිරීම් කටයුතු විගණිත දින වූ 2012 ජනවාරි 04 දින වන විටත් නිමකර නොතිබූ අතර, කාර්ය සාධන බැදුම්කරයේ කාලය දීර්ඝ කරවා ගැනීමට කටයුතු නොකර 2011 දෙසැම්බර් 31 දින වන විට ගෙවීම සඳහා පිළියෙල කර තිබූ හතරවන බිල්පතෙන් කාර්ය සාධන බැදුම්කරයේ වටිනාකම වූ රු.908,002ක් අඩු කර කොන්ත්‍රාත්කරුට ගෙවීමට සැළසුම් කර තිබුණි.

2.9. මෙහෙයුම් අකාර්යක්ෂමතා.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ).කොළඹ නගරයේ සුනඛගහණය පාලනය කිරීම නාගරික සුනඛාගාරයේ ප්‍රධාන කාර්යයක් වී තිබුණ ද කොළඹ ජාතික රෝහලෙන් ලබාගත් තොරතුරු අනුව 2011 වර්ෂය තුල බල්ලන් සපාකෑම නිසා රෝහලේ බාහිර රෝගී අංශයෙන් එන්නත් ලබාගත් රෝගීන් සහ රඳවාගෙන ප්‍රතිකාර කළ රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් 12,906ක් හා 3,471ක් වී තිබූ අතර එම රෝගීන්ගෙන් වැඩි ප්‍රමාණයක් කොළඹ නගරය තුලදී බල්ලන් සපාකෑම නිසා සිදුවූ අනතුරු බව වාර්තා විය.

(ආ) සභාව සතු කොටහේන බටහිර බෙහෙත් ශාලා භූමියේ අනවසරව පදිංචිව සිටි තැනැත්තියක් එම භූමියෙන් ඉවත් කිරීම සඳහා කාලිංග මාවතේ පිහිටි සභා දේපලකින් පර්චස් 01ක මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 36(i)(iii) ජේදයේ විධිවිධාන වලට පටහැනිව විශේෂ කොමසාරිස් විසින් අනවසර පදිංචිකාරිය වෙත 2011 මාර්තු 10 දින ප්‍රදානය කර තිබුණි.

2.10. සුදුවැල්ල ගබඩාවේ තොග ඌනතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). වාර්ෂික තොග සමීක්ෂණයේදී හෙළිදරව් කර ගෙන තිබූ 2004 ජූලි සිට 2009 පෙබරවාරි කාලය තුළ සිදු වූ රු.1,080,789 ක තොග ඌනතා වටිනාකම වගකිව යුතු නිළධාරියාගෙන් 2012 මාර්තු සිට රු.5000 බැගින් වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කර තිබුණද, ඔහු විශ්‍රාම යන දිනට එනම් 2014 පෙබරවාරි 23 දිනට ඔහුගෙන් අයකළ හැකි මුදල හා විශ්‍රාම පාර්තෝෂිකයෙන් අය කල හැකි මුදල තොග ඌනතාවය පියවා ගැනීමට ප්‍රමාණවත් නොවන බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) 2008 ජුනි 09 දිනට පැවති රු.1,189,453ක තොග ඌනතාවයක් සම්බන්ධයෙන් වගකිවයුතු එකී ගබඩාවේ තවත් ගබඩා භාරකරුවෙකුට 2012 සැප්තැම්බර් 13 දින වන විටත් චෝදනා පත්‍ර නිකුත් කර විධිමත් විනය පරීක්ෂණය කිරීමට හා ඌනතාවයේ වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබිණි.

(ඇ) ප්‍රධාන ගබඩා භාරකරු විසින් භාණ්ඩ නිකුත් පත්‍රයකට වටිනාකම රු.1,297,639 ක භාණ්ඩ වර්ග 06ක් අක්‍රමිකව ඇතුලත් කර ගබඩාවෙන් පිටතට රැගෙන යාම සම්බන්ධයෙන් වූ අක්‍රමිකතාවයේ වටිනාකමින් කොටසක් අයකරගෙන තිබුණද තවදුරටත් රු.247,639 ක් අයකර ගත යුතුව තිබුණි.

(ඈ). ශ්‍ර ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 770 ප්‍රකාර 2011 දෙසැම්බර් 31 දිනට කර තිබූ භෞතික තොග සමීක්ෂණයේ දී වටිනාකම ගණනය කර නොතිබූ ඌන උපයෝජිත භාණ්ඩ තොගයක් නිරීක්ෂණය වී තිබුණද අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණු අතර ඊට අමතරව නිරීක්ෂණය වී තිබූ අතිරික්තතා හා ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.11. මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). නාගරික කර්මාන්ත ශාලාව පරිහරණය කරනු ලබන අංක 21-4358 දරන ත්‍රි වීල් රථය අලුත්වැඩියා කිරීම සඳහා 2010 ජනවාරි 31 දින පෞද්ගලික ගරාජයකට භාර දී 2010 මැයි 21 දින රු.74,350 ක් ගෙවා තිබුණි. අලුත්වැඩියාවෙන් පසු එන්ජිමේ අංකය හඳුනා ගත නොහැකි ආකාරයට කැඩී ගොස් තිබූ බව අනාවරණය වී තිබුණි. රථයේ වර්ණයද ආයතනයේ කිසිදු උපදෙසක් නොමැතිව වෙනස් කර තිබුණද, මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ). නාගරික කර්මාන්ත ශාලාව විසින් වාහන අලුත්වැඩියාවන් සඳහා පෞද්ගලික ගරාජයන් වෙත 2007-2009 වර්ෂවල භාරදී තිබූ වාහන 3ක් විගණිත දිනය වූ 2012 මාර්තු 13 දින වන විටත් ආපසු බාර දී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වාහන අංකය | වර්ගය | ඇස්තමේන්තු මුදල | අළුත් වැඩියාවට භාර දුන් දිනය | ප්‍රමාද කාලය |
|---|---|---|---|---|
| | | රු. | | |
| 40-5309 | Sky lift | 1,325,600 | 2007.05.23 | වසර 04 |
| LW -0272 | ගිලන් රථය | 148,500 | 2009.05.19 | වසර 02 |
| 41-8079 | ගිනි නිවන රථය | 149,500 | 2009.05.19 | වසර 02 |

2.12. මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2011 දෙසැම්බර් 31 දිනට අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 348 | 234 |
| තෘතීය | 996 | 532 |
| ද්විතීය | 2,367 | 1,145 |
| ප්‍රාතමික | 8,427 | 4,770 |
| | 12,138 | 6,681 |

(ආ). ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XI පරිච්ඡේදයේ 13:1:1 වගන්තිය ප්‍රකාර වැඩබැලීමේ හා රාජකාරි ඉටුකිරීමේ පත්වීම් සඳහා බලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, නිලධාරීන් 8 දෙනෙකුට, අදාල පත්වීම් බළධාරියාගේ අනුමැතිය ලබා නොගෙන දෙපාර්තමේන්තු 05ක 2004 මැයි 31 සිට 2012 මාර්තු 14 දක්වා පත්වීම් ලබා දී තිබුණි.

(ඇ). ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XI පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරවැඩබැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවද, දෙපාර්තමේන්තු හා උපකාර්යාල 20ක නිලධාරීන් 155ක් වසර 01 සිට 10කට වැඩි කාලයක් තුල වැඩ බැලීම් හා රාජකාරි ඉටුකිරීම සඳහා පත්කර තිබූ අතර 2011 වර්ෂයට රු.2,885,788ක වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි.

(ඇ). 2007 මැයි 11 දිනැති අංක: 09/2007 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (iii) හා (iv) වගන්ති ප්‍රකාර විශ්‍රාමිකයන් නැවත සේවයේ යෙදවීම මාස දොළහක (12) කාලයකට සීමාකර තිබුණද, ඊට පටහැනිව විශ්‍රාමික නිලධාරීන් 08 දෙනෙකු වසර 1 සිට වසර 7

දක්වා කාලයක් තුල සේවයේ යොදවා ගෙන තිබුණි. නැවත සේවයේ යොදවනු ලබන කාලසීමාව තුලදී ආයතන ප්‍රධානියා විසින් සුදුසු අනුප්‍රාප්තිකයකු හඳුනාගෙන ඔහු පුහුණු කිරීමේ කාර්යය, විශ්‍රාමික නිලධාරියාගේ වගකීමක් වශයෙන් ඔහුට පවරණු ලැබිය යුතු වුවත්, සුදුසු අනුප්‍රාප්තිකයන් හඳුනා ගැනීමට අදාල අංශ ප්‍රධානීන් දැනුවත් කර නොතිබුණි. එසේම එකී වගකීම විශ්‍රාමික නිලධාරීන්ගේ රාජකාරී පැවරුම් ලිපිවලට ඇතුලත් කර නොතිබුණි.

(ඉ). මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2011 මාර්තු 09 දිනැති අංක MF/12/958/38/1245 දරන ලිපිය පරිදි වයස 60 ඉක්මවූ නිළධාරීන් රාජ්‍ය සේවයේ නිත්‍ය තනතුරු වලට පත් නොකිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය මත සේවා කාලය දීර්ඝ කල නොහැකි වුවද වසර 60 ඉක්මවූ නිලධාරීන් 08 දෙනෙකු 2005 නොවැම්බර් 04 දින සිට 2012 ජනවාරි 31 දින දක්වා යොමුගත ලිපියේ විධිවිධාන වලට පටහැනිව දෙපාර්තමේනතු 06ක සේවයේ යොදවා තිබුණි.

(ඊ). 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි නාගරික කර්මාන්ත ශාලාවේ කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීම වෙනුවට සේවක කණ්ඩායම් දෙකක් වෙනුවෙන් වෙන වෙනම වේලා සටහන් යන්ත්‍ර 02ක් භාවිතා කර තිබුණි.

2.13. අයවැය පාලනය.
-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාවේ ආදායම් හා වියදම් තථ්‍ය පදනමක් මත, ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් / වියදම් අතර සැලකිය යුතු අසාමාන්‍ය විචලනයන් නිරීක්ෂණය විය.

(ආ). වැය විෂයන් 18ක් වෙනුවෙන් වාර්ෂික අයවැය ලේඛනය මගින් වෙන්කර තිබූ රු.279,577,000 ක ප්‍රතිපාදන වලට අමතරව රු.567,211,160 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයන් වලින් මාරු කරගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර මෙම මාරු කිරීම්, මුල් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සැලකීමේදී 55% හේ සිට 859% දක්වා පරාසයක් තුල දෝලනය වී තිබුණි.

(ඇ). දෙපාර්තමේන්තු 16 ක වැය විෂයන් 308 ක් සඳහා සලසා තිබූ එකතුව රු.318,705,100 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ඈ). දෙපාර්තමේන්තු 7 ක වැය විෂයන් 24 ක් වෙනුවෙන් සලසා තිබූ ප්‍රතිපාදන රු.146,360,000 ක් මුළුමනින්ම වෙනත් වැය විෂයන් සඳහා මාරු කර තිබුණි.

## 3. පද්ධති හා පාලන.

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කලමනාකරණය
(ඊ) සේවක ණය
(උ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඌ) වාහන පාලනය